# 2019

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2019

අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදි.

2020 මැයි


නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2019.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු ඩලස් අලහප්පෙරුම පා.ම.

**අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය**

ගරු රංජිත් සියඹලාපිටිය පා.ම.

**අධ්‍යාපන ලේකම්**

එන්.එච්.එම්.චිත්‍රානන්ද

**ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

අතිරේක ලේකම් - ආචාර්ය මධුරා එම් වෙහැල්ල මිය

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක

**අධ්‍යාපන සේවා ආයතන අංශය**

අතිරේක ලේකම් - පී.එම්.සලාහුදීන්

**ප්‍රසම්පාදන ඉදිකිරීම් හා පාසල් සැපයීම් අංශය**

අතිරේක ලේකම් - කේ.ඒ.සී.ආර්.නිශාන්ති ජයසිංහ මිය

**පාසල් කටයුතු අංශය**

අතිරේක ලේකම් - ආර්.එම්.එම්. රත්නායක

**ආයතන අංශය**

අතිරේක ලේකම් - අනූෂා ගෝකුල ප්‍රනාන්දු මිය

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය**

අතිරේක ලේකම් - ආර්.එම්.එම්. රත්නායක

**පාලන අංශය**

අතිරේක ලේකම් - එච්.හේවගේ

**මූල්‍ය අංශය**

අධ්‍යක්ෂ ජනරාල් - ඩී.එල්.ඒ. විජේනායක

ප්‍රධාන මූල්‍ය නිලධාරී - වයි.එම්.එස්.ගුණසේකර

# පටුන


**පරිච්ඡේද 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 01 |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු | 01 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 02 |
| 1.4 | සංවිධාන සටහන | 04 |
| 1.5 | අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු | 05 |
| 1.6 | අමාත්‍යාංශය යටතේ පවතින ආයතන | 05 |
| 1.7 | විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු | 06 |
| 1.8 | අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් - 2018 | 07 |

**පරිච්ඡේද 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

| | | |
|---|---|---|
| 2.1 | විශේෂ ජයග්‍රහණ හා ළඟා කර ගත් ප්‍රගතිය | 09 |
| 2.2 | පවත්නා අභියෝග | 22 |
| 2.3 | ඉදිරි ඉලක්ක | 23 |

**පරිච්ඡේද 03 - මූල්‍ය කාර්ය සාධනය**

| | | |
|---|---|---|
| 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 27 |
| 3.3 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 28 |
| 3.4 | මුදල් ප්‍රවාහ ප්‍රකාශ | 29 |
| 3.5 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 31 |
| 3.6 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 32 |
| 3.7 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 32 |
| 3.8 | මු.රෙ.208 ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 33 |
| 3.9 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 34 |
| 3.10 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 34 |

**පරිච්ඡේද 04 - කාර්ය සාධන දර්ශක**

| | | |
|---|---|---|
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 35 |

**පරිච්ඡේද 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

| | | |
|---|---|---|
| 5.1 | හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු | 39 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 40 |

**06. මානව සම්පත් පැතිකඩ**

| | | |
|---|---|---|
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 41 |
| 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | 41 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 43 |

**07. අනුකූලතා වාර්තාව**

| | | |
|---|---|---|
| 7.1 | අනුකූලතා වාර්තාව | 57 |

ඇමුණුම්

# 01. පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ව ජාතික පොදු අරමුණු ඉටුකර ගැනීම උදෙසා වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ නීති හා අණපනත්වලින් පැනවෙන විධිවිධාන හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වගකීම දරමින් පළාත් අධ්‍යාපන අධිකාරීත්වයත් සමඟ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන භූමිකාවකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම හා අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රමිතීන් සහතික කිරීමට විධිමත් ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීම ද අමාත්‍යාංශයේ වගකීම් අතර වේ. මෙහිලා ගුරු අධ්‍යාපනය හා ගුරු සංවර්ධනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යභාර්යයක් වේ. අධ්‍යාපන ප්‍රමිති සහතික කිරීමට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් ව සැපයීම හා විධිමත් සුපරීක්ෂණ ක්‍රියාවලියක් දියත් කිරීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන වගකීම් අතර වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට පැවරී ඇති පාසල් විෂයමාලා සම්පාදනය, පෙළපොත් සම්පාදනය, ඇගයීම හා තක්සේරුකරණය වැනි වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරුව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම් භාරයට අයත් වේ.

2019.12.10 දිනැති ගැසට් නිවේදනය අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය හා අනුබද්ධ ආයතන පිළිබඳ විස්තර 1.3, 1.5හා 1.6 යටතේ දක්වා ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

**මෙහෙවර**

පාර්ශ්වකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද නව්‍ය ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

**ආයතනයේ අරමුණු**

- ප්‍රමාණවත් හා ගුණාත්මක මානව හා භෞතික සම්පත් සපුරාලමින් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම මගින් සැමට සම අධ්‍යාපන අවස්ථා සහ අනිවාර්ය නිදහස් අධ්‍යාපනය සහතික කිරීම සහ අධ්‍යාපන සම්පත් උපයෝගී කර ගැනීම ප්‍රශස්ත කිරීම.
- අධ්‍යාපනයේ අසමානතා අවම කිරීමට ක්‍රියා කර අර්ථවත් ඉගෙනීම සඳහා ප්‍රවේශය හා සහභාගීත්වය පිළිබඳ සම අවස්ථා සහතික කිරීම.
- ශිෂ්‍ය ඉගෙනුම් ඵල වැඩිදියුණු කිරීම සහ සියලු අධ්‍යාපන මට්ටම්වල සෑම ශිෂ්‍යයෙකුගේ ම ඉගෙනීම සහතික කිරීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලියේ සමස්ත ගුණාත්මකභාවය, ඵලදායීතාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ කාර්යක්ෂමතාව, වගවීම සහ හිමිකාරීත්වය වැඩි දියුණු කිරීම.
- සිසුන් තුළ 21 වන සියවසේ කුසලතා එනම්, පරිවර්තීය කුසලතා, සමාජීය හා පෞද්ගලික කුසලතා, ගැටළු විසඳීම, ඉගෙනීමේ කුසලතා සහ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම.

- අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා ළඟා වීම.
- අධ්‍යාපනයේ සේවා සැපයීම පිළිබඳ බලතල එක් එක් තලයන් සඳහා පැවරීම.
- අධ්‍යාපන ක්‍රියාවලිය තුළ යහපාලනය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම.
- ගුරු භූමිකාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ගුරු කළමනාකරණ පද්ධතිය සංවර්ධනය.
- ඉගෙනුම් ඵල ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම;
- සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ප්‍රමාණවත් බව සහතික කිරීම.
- පුරවැසියන්ගේ සංස්කෘතික අනන්‍යතා, ආචාර ධර්ම සහ සාරධර්ම කෙරෙහි අවධානය යොමු කරමින් අධ්‍යාපන පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. අධ්‍යාපන විෂයයට සහ 1.3 මගින් දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ 1.4 හි සඳහන් නීති හා අණපනත්වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
3. පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්ති ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ නියාමනය.
4. ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව පාසල් සිසුන්ට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.
5. ජාතික පාසල් සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් යුත් ළමා මිතුරු පරිසර හිතකාමී සියළු මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
6. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර පාසල් නියාමනය කිරීම.
7. ඉගෙනුම් හා ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා පරිගණක විද්‍යාගාර ඇතුළු නූතන තාක්ෂණික පහසුකම් යොදා ගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය.
8. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය හා සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම.
9. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
10. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පාසල් පෙළපොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
11. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය.
12. සියලු පාසල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පන්ති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් හා පරිසර හිතකාමී පාසල් සංවර්ධනය ජාතික පාසල්වල මෙන්ම පළාත් සභාවලට අයත් පාසල්වලට ද පොදු ප්‍රමිතියක් යටතේ දියුණු කිරීම.
13. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය සමග සම්බන්ධ වූ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු.
14. ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ පළාත් සභා පාසල්, ජාත්‍යන්තර පාසල්, පෞද්ගලික පාසල්වල අධ්‍යාපනය හා ශිෂ්‍ය සුභ සාධන, ප්‍රවාහන, සනීපාරක්ෂක කටයුතු සම්බන්ධීකරණය.
15. ඵලදායී ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බඳවාගැනීම හා ගුරුවරුන් පුහුණු කිරීමේ හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය.
16. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

17. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය.
18. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම.
19. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම.
20. 1.3 මගින් දැක්වෙන අමාත්‍යාංශයට අනුබද්ධ සියලුම ආයතන අධීක්ෂණය කිරීම සහ පැවරී ඇති සියලුම විෂයයන්ට අදාළ කටයුතු.

# 1.4 අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය (2015.06.14 දිනට අනුමත)




Approved by Secretary/ Education on 2015/06/14

## 1.5 අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 1.6 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන

- ජාතික අධ්‍යාපන ආයතනය
- ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
- ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික අධිකාරිය
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
- ගුරු විද්‍යාල
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
- පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
- රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

## 1.7 විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

| ව්‍යාපෘතිය | ආධාර සපයන ආයතනය | ඇස්තමේන්තුගත සමස්ත ආයෝජනය | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම | කොරියානු ජනරජයට අනුබද්ධිත අන්තර්ජාතික කොරියානු සහයෝගීතා ඒජන්සිය (KOICA) | රු.මිලියන 1295 | 2018-2020 |
| විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යාපනය බලගැන්වීම | අන්තර්ජාතික ජපන් සහයෝගීතා ඒජන්සිය (JICA) | යෙන් මිලියන 435 | 2019-2022 |
| කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් අධ්‍යාපනය නගා සිටුවීමේ ව්‍යාපෘතිය | කොයිකා (KOICA) | US $ මිලියන 7.5 | 2018-2022 |
| තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය | අන්තර්ජාතික සංවර්ධනය සඳහා OPEC අරමුදල (OFID) | US $ මිලියන 60.7 | 2018-2022 |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | ලෝක බැංකුව | US $ මිලියන 100 | 2018-2023 |
| ද්විතියීක අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Hubs) ස්ථාපනය | Korean Exim Bank | රු.මිලියන 4281 | 2019-2021 |
| අධ්‍යාපන වැඩසටහන් (යුනිසෙෆ් ආධාර) | යුනිසෙෆ් ආයතනය | රු.මිලියන 25.0 | වාර්ෂික (2019) |
| යුනෙස්කෝ ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති | යුනෙස්කෝ ආයතනය | රු.මිලියන 14.8 | වාර්ෂික (2019) |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (UNFPA ආධාර) | UNFPA | රු.මිලියන 2.0 | වාර්ෂික (2019) |

## අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් (2018)

### රජයේ පාසල් සංඛ්‍යාව - 10,175

| පාසල් වර්ගය අනුව | |
|---|---|
| 1AB වර්ගය | 1,044 |
| 1C වර්ගය | 1,845 |
| 2 වර්ගය | 3,227 |
| 3 වර්ගය | 4,059 |

| පරිපාලන අධිකාරිය අනුව | |
|---|---|
| ජාතික | 353 |
| පළාත් | 9,822 |

### රජයේ පාසල්වල ගුරු සංඛ්‍යාව - 247,334

| ස්ත්‍රී පුරුෂභාවය අනුව | |
|---|---|
| ස්ත්‍රී | 183,024 |
| පුරුෂ | 64,310 |

| සුදුසුකම් අනුව | |
|---|---|
| උපාධිධාරී | 110,741 |
| පුහුණු | 130,635 |
| වෙනත් | 5,958 |

### රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව - 4,214,772

| ස්ත්‍රී පුරුෂභාවය අනුව | |
|---|---|
| ස්ත්‍රී | 2,132,076 |
| පුරුෂ | 2,082,696 |

| ඉගෙනුම ලබන මාධ්‍ය අනුව | |
|---|---|
| සිංහල මාධ්‍ය | 3,098,539 |
| දෙමළ මාධ්‍ය | 1,026,877 |
| ද්වි භාෂා | 89,356 |

### පෞද්ගලික පාසල් හා පිරිවෙන්

| පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|
| පැවිදි | 32,160 |
| ගිහි | 28,715 |
| එකතුව | 60,875 |

| පෞද්ගලික පාසල් හා පිරිවෙන් සංඛ්‍යාව | |
|---|---|
| රජයේ අනුමත පෞද්ගලික පාසල් සංඛ්‍යාව | 80 |
| විශේෂ පාසල් සංඛ්‍යාව | 26 |
| පිරිවෙන් සංඛ්‍යාව | 763 |

| | |
|---|---|
| පෞද්ගලික පාසල් හා විශේෂ පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව | 139,581 |

මූලාශ්‍රය : පාසල් සංගණනය - 2018


Mathematics is the queen of science





# 02. පරිච්ඡේදය
# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 විශේෂ ජයග්‍රහණ හා ළඟා කරගත් ප්‍රගතිය

### 2.1.1 එක් එක් විෂයය ක්ෂේත්‍රය යටතේ ළඟා කර ගත් ප්‍රගතිය

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම** | |
| 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | ♦ 2017 වර්ෂයේ පාසල් 42ක ආරම්භ කරන ලද අ.පො.ස. (උ.පෙ.) වෘත්තීය විෂයධාරාව 2019 වර්ෂය වන විට පාසල් 311ක් දක්වා වැඩි කිරීම :- සමස්තයක් ලෙස සිසුන් 20,730ක් පමණ මේ වන විට මෙම වැඩසටහන යටතේ වෘත්තීය විෂයධාරාව හැදෑරීමට යොමුව ඇත.<br>♦ 2017 වසරේ බඳවාගත් පළමු අදියර සිසුන් 1,545ක් හා 2018 වසරේ බඳවාගත් සිසුන් 6,500ක් ප්‍රයෝගික වෘත්තීය පුහුණුව සඳහා රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයේ ආයතනික පුහුණුවට යොමු කිරීම :- 2017 වසරේ සිසුන් අතරින් 1,143ක් පුහුණුව සම්පූර්ණ කරන ලදී. |
| **ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය හා සහභාගිත්වය ඉහළ නැංවීම** | |
| ජාතික පාසල් සංවර්ධනය සහ නව ජාතික පාසල් ඇති කිරීම | ♦ 2018 වර්ෂයේ 353ක් වූ ජාතික පාසල් සංඛ්‍යාව 2019 වන විට 373ක් දක්වා වැඩි කිරීම සහ ජාතික පාසල්වල භෞතික හා ගුණාත්මක සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>♦ නව ත්‍රෛභාෂා ජාතික පාසල් ඉදිකිරීම් යටතේ කොළඹ හා නානුඔය පාසල් ඉදිකිරීම්වලට අදාළව ඉඩම් අත්පත්කර ගැනීමේ හා මූලික සැලසුම් කටයුතු සිදු කිරීම සහ පොළොන්නරුවේ ත්‍රෛභාෂා පාසල සඳහා ගොඩනැඟිලි ඉදිකිරීමේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම. |
| විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය සවිබල ගැන්වීම | ♦ වෙනිවැල්කොළ ඉදිකරනු ලබන විශේෂ අධ්‍යාපන ජාතික සම්පත් මධ්‍යස්ථානයේ ගොඩනැඟිලි සහ ජල චිකිත්සා තටාකය ඉදිකිරීමේ කටයුතු නිම කිරීම.<br>♦ විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ සහභාගීත්වයෙන් පළාත් හා ජාතික මට්ටමින් ක්‍රීඩා තරගාවලියක් පැවැත්වීම.<br>♦ බුද්ධිමය ආබාධිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.<br>♦ නැණසරණ වැඩසටහන යටතේ මාවත්වාසී ළමුන් 125ක් සඳහා සාක්ෂරතා පන්ති පැවැත්වීම.<br>♦ විශේෂ හා නොවිධිමත් අධ්‍යාපන වෘත්තිකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම තුලින් එම වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩි කිරීම. |
| පිරිවෙන් අධ්‍යාපන සංවර්ධනය | ♦ පිරිවෙන් 768ක් සඳහා වාර්ෂික ආධාර ලබා දීම.<br>♦ පිරිවෙන් 70ක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම හා පිරිවෙන් 50කට කාර්යාල ගොඩනැඟිලි ලබා දීම.<br>♦ නවක පරිවේනාචාර්යවරු 475ක් බඳවා ගැනීම<br>♦ පරිවේණාචාර්යවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම තුලින් පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| වතු පාසල් සංවර්ධනය සහ දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය | ♦ 2018 වසරේ වතු පාසල් 29ක ආරම්භ කළ නව ගොඩනැගිලි ඉදිකිරීම්වලින් 19ක් සම්පූර්ණ කිරීම හා 2019 වසරේ තවත් වතු පාසල් 37ක නව ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කිරීම.<br><br>♦ වතු පාසල් ශිෂ්‍යයන්ගේ ගණිත සාධනය ඉහළ නැංවීම සඳහා සබරගමුව පළාතේ පාසල් 38ක නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br><br>♦ වතු පාසල්, මුස්ලිම් පාසල් හා දෙමළ පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය තුලින් එම පාසල් වල අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩි කිරීම. |
| පෞද්ගලික පාසල් සම්බන්ධ කාර්යයන් | ♦ රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු ගණනය සඳහා නිකුත් කරන ලද 17/2018 චක්‍රලේඛය පිළිබඳව පාසල් දැනුම්වත් කිරීම.<br><br>♦ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නෛතික වලංගුතාවය ලද රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් 9හි පරිපාලන හා ආයතනික කටයුතු සිදු කිරීම පිළිබඳව අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීම. |
| පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන | (see table below)<br><br>♦ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන, ආර්තව ස්වස්තතාව, මානසික සෞඛ්‍ය සංවර්ධනය, ප්‍රජනන සෞඛ්‍යය, ස්ථූලතාව, මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා නිලධාරීන් දැනුම්වත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පළාත් හා ජාතික මට්ටමින් පැවැත්වීම.<br><br>♦ පාසල් ආපනශාලා ඇගයීම සඳහා මෙවලම් කට්ටලයක් පිළියෙල කිරීම හා ආපනශාලා ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැනුම්වත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |

| වැඩසටහන | ප්‍රතිලාභී සිසුන්/පාසල් සංඛ්‍යාව |
|---|---|
| පාසල් ළමුන් සඳහා දිවා ආහාර ලබා දීම. (2019) | සිසුන් 1,067,465 |
| පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබාදීම. (2019) | සිසුන් 406,257 |
| පාසල්වල සනීපාරක්ෂක පහසුකම් දියුණු කිරීම. (2016 - 2019)<br>♦ ළඟම පාසල හොඳ ම පාසල යටතේ<br>♦ වෙනත් වැඩසටහන් යටතේ | <br><br>පාසල් 3,206<br>පාසල් 1,799 |
| පාසල්වල ජල පහසුකම් දියුණු කිරීම. (2016 - 2019)<br>♦ ළඟම පාසල හොඳ ම පාසල යටතේ<br>♦ වෙනත් වැඩසටහන් යටතේ | <br><br>පාසල් 617<br>පාසල් 390 |
| පාසල් සඳහා දන්ත සායන ලබාදීම. (2016 - 2019)<br>♦ නව ගොඩනැගිලි<br>♦ අලුත්වැඩියා | <br><br>පාසල් 11<br>පාසල් 88 |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ♦ වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් 770ක් දැනුවත් කිරීම.<br>♦ පාසල්වල උපදේශන ඒකක සංවර්ධනය, ළමා ආරක්ෂාව පිළිබඳ "දරුවන් සුරකිමු" වැඩසටහන, මානසික ප්‍රථමාධාර පිළිබඳ වැඩසටහන හා පරිගණක ප්‍රජානනචර්යා ප්‍රතිකාර වැඩසටහන හරහා ගුරුවරු, ගුරු උපදේශකවරු හා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය තුළින් පාසල් උපදේශන වැඩසටහන බලගැන්වීම. |
| ජාතික විෂයමාලාව විවිධාංගිකරණය හා නවීකරණය | ♦ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව ජාතික අධ්‍යාපන ආයතනය විසින් සෑම වසර 8කටම වරක් සිදු කරන විෂයමාලා සංශෝධනයෙහි 2012-2020 විෂය මාලා චක්‍රයට අදාළව 2019 වර්ෂයේ දී 4 ශ්‍රේණියට නියමිත නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම.<br>♦ ශිෂ්‍ය කේන්ද්‍රීය විෂයමාලාවක් සඳහා ජාතික විෂයමාලා රාමුවක් සකස් කිරීම. |
| ගණිත අධ්‍යාපනය සංවර්ධනය | ♦ ක්‍රියාකාරකම් පාදකව ගණිතය ඉගෙනීම ප්‍රවර්ධනය සඳහා බස්නාහිර, මධ්‍යම හා ඌව පළාත් 3හි පාසල් 80ක නිදහස් ඉගෙනුම් පන්ති කාමර, විමසීම් පාදක ඉගෙනීම හා බහුතල ඉගෙනුම් යන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.<br>♦ ක්‍රියාකාරකම් පාදක ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් පාසල්වල ගුරුවරු 215කගේ කුසලතා සංවර්ධනය කිරීම.<br>♦ ගණිත ක්‍රියාමූලික පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම උදෙසා නිලධාරීන් හා ගුරුවරු 110ක් ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ බලගැන්වීම.<br>♦ තෝරාගත් පාසල් 150ක සිසුන්ගේ ගණිත කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>♦ ප්‍රාථමික ගුරුවරු සහ 6 -11 ශ්‍රේණිවල ගණිත ගුරුවරු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම තුළින් සිසුන්ගේ ගණිත කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පියවර ගැනීම.<br>♦ සමස්ත ලංකා පාසල් ගණිත තරඟාවලිය පැවැත්වීම සහ ජාත්‍යන්තර ගණිත ඔලිම්පියාඩ් වැඩසටහන සඳහා ශිෂ්‍යයින් තෝරා පුහුණු කර සහභාගි කරවීම. |
| විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම | ♦ අ.පො.ස (සා.පෙ.) විද්‍යාව සඳහා 6-11 ගුරුවරු පුහුණු කිරීමට මොඩියුල 02ක් සකස් කිරීම සහ ගුරුවරු 2,201ක් පුහුණු කිරීම.<br>♦ විද්‍යා ගුරුවරු, විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන කළමනාකරුවන්, විද්‍යා විෂයභාර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය තුළින් විද්‍යා අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම.<br>♦ මැලේසියාවේ පැවති 2019 ජාත්‍යන්තර තරුණ විද්‍යාඥයින්ගේ වැඩසටහන සඳහා සිසුන් 04 දෙනෙකු සහභාගී කරවීම :- ලෝකඩ පදක්කම් 1ක් හා ජූරියේ විශේෂ ත්‍යාග 02ක් දිනා ගැනීම.<br>♦ 2019 ජාත්‍යන්තර ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලියට සිසුන් 06ක් සහභාගී කරවීම :- රන් පදක්කම් 1ක් හා ලෝකඩ පදක්කම් 3ක් දිනා ගැනීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය | ♦ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි (ABOE) 1 ශ්‍රේණියට අදාළව අත්පොතක් සකස් කිරීම.<br>♦ iTESL ගුරු අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු 163 දෙනෙකු පුහුණු කිරීම.<br>♦ අඛණ්ඩ ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන යටතේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම පිළිබඳව ගුරුවරු 6,250ක් පුහුණු කිරීම සහ ගුරු උපදේශකවරු 316ක් ඇතුළුව සම්පත් පුද්ගලයින්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.<br>♦ GEMP ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය සඳහා තෝරා ගත් පාසල්වල ඉංග්‍රීසි අධ්‍යාපනය සංවර්ධනය සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ගුරු මාර්ගෝපදේශ හා අතිරේක ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>♦ තෝරා ගත් පාසල් 55ක් වෙත Reading Corner සැකසීම සඳහා ප්‍රතිපාදන ලබා දීම සහ Scrabble Board 3,400ක් ලබා දීම. |
| තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය | ♦ අ.පො.ස (උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව සහිත පාසල් 94ක් සඳහා රොබෝ තාක්ෂණ කට්ටල හා රොබෝ තාක්ෂණ උපදෙස් ග්‍රන්ථය බෙදා දීම.<br>♦ ඉංජිනේරු තාක්ෂණවේදය හා නිර්මාණ තාක්ෂණවේදය විෂය ඇගයීම් මෙවලම් කට්ටල සකස් කිරීම හා ගුරුවරු පුහුණු කිරීම.<br>♦ ජාතික නව නිපැයුම් තරඟාවලිය හා පාසල් රොබෝ තරඟාවලිය පැවැත්වීම.<br>♦ OFID ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත තාක්ෂණ විෂය ධාරාව බලවත්ත කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ඒකකයක් පිහිටුවීම සහ ඉදිරි සැලසුම් සකස් කිරීම.<br>♦ තාක්ෂණ විෂයධාරාවේ ගුරුවරු පුහුණු කිරීම සඳහා KOICA ආධාරයෙන් කුලියාපිටියේ ඉදිකරනු ලබන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට මුල්ගල් තැබීම. |
| **සිසුන් තුළ පරිවර්තීය කුසලතා, සමාජ චිත්තවේග කුසලතා, ආචාරධර්ම හා සාරධර්ම ගොඩනැංවීම** | |
| ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනය | ♦ ප්‍රාථමික ශ්‍රේණිවල බහුතල ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව ප්‍රාථමික ගුරුවරු 250ක් පුහුණු කිරීම.<br>♦ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරකම් කාමරය හා කියවීම් කාමරය භාවිතය පිළිබඳව ගුරුවරුන් හා සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම.<br>♦ ප්‍රාථමික සිසුන්ගේ ගණිත දැනුම ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ගුරු උපදේශකවරු 190ක් හා විෂයභාර නිලධාරීන් පුහුණු කිරීම. |
| ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය සංවර්ධනය කිරීම | ♦ අඛණ්ඩ ගුරු වෘත්තීය සංවර්ධනය වැඩසටහන යටතේ සිංහල භාෂාව, දෙමළ භාෂාව, දෙවන ජාතික භාෂාව සහ සමාජ විද්‍යා විෂයයන් උගන්වන ගුරුවරුන් පළාත් මට්ටමින් පුහුණු කිරීම. |
| ද්වි භාෂා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම | ♦ විෂය හා භාෂාව සමෝධානිත ක්‍රියාකාරකම් සහිතව බටහිර සංගීතය, භූගෝල විද්‍යාව සහ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයන් ඉගැන්වීම සඳහා අත්පොත්, DVD සකස් කිරීම සහ පුහුණුකරුවන් පුහුණු කිරීම.<br>♦ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, විද්‍යාව, තොරතුරු තාක්ෂණය, පුරවැසි අධ්‍යාපනය, ගණිතය හා භූගෝල විද්‍යාව යන විෂයයන් සඳහා විෂය පාදක ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම් ගුරු පුහුණු වැඩසටහන් නියාමක මට්ටමින් ක්‍රියාත්මක කිරීම.<br>♦ සිසුන්ගේ ත්‍රෛභාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| ආගමික හා සාරධර්ම අධ්‍යාපනය | ♦ බුද්ධ ධර්මය, හින්දු ධර්මය, කතෝලික හා ක්‍රිස්තියානි ධර්මය හා ඉස්ලාම් ධර්මය යන විෂයයන්හි ශිෂ්‍ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ගුරු පුහුණු වැඩසටහන් හා විෂය සම්මන්ත්‍රණ පැවැත්වීම. |
| කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සංවර්ධනය | ♦ ජෛව පද්ධති තාක්ෂණය ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව අත්පොත සහ විද්‍යාගාර සහායකයින් සඳහා උපදෙස් සංග්‍රහය සකස් කර විද්‍යාගාර සහායකයින් පුහුණු කිරීම.<br>♦ නවීන කෘෂිකර්මය පරිසර සංරක්ෂණය, වෙරළ සංරක්ෂණය යන විෂයයන් ඔස්සේ ගුරුවරු හා ගුරු උපදේශකවරු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. |
| වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය | ♦ ඉගෙනුම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අ.පො.ස. (සා.පෙ.) ගුරුවරු 489ක් සහ හා අ.පො.ස. (උ.පෙ.) ගුරුවරු 899ක් පුහුණු කිරීම.<br>♦ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන පාසල් ගිණුම්කරණ පද්ධතිය වඩාත් ඵලදායීව විනිවිදභාවයකින් හා උපරිම කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගැනීම සඳහා ගණකාධිකාරී ශිල්පීය ආයතනය (AAT) සමඟ ජාතික සහ පළාත් පාසල්වල හොඳම වාර්ෂික ගිණුම් වාර්තා තරඟාවලිය පවත්වා සම්මාන ප්‍රදානය කිරීම. |
| පාසල් පුස්තකාල සංවර්ධනය | ♦ ශිෂ්‍යයින්ගේ පොත් කියවීම ප්‍රවර්ධනය කිරීම සඳහා “කළණ මිතුරු පොත් සුමිතුරු” කියවීම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>♦ ජාතික පාසල්වලට පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු.මි.38ක මුදලක් ජාතික පාසල් අතර බෙදා දීම. |
| විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සංවර්ධනය | ♦ පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පාසල් 300ක විෂය සමගාමී නියෝජ්‍ය විදුහල්පතිවරු දැනුම්වත් කිරීම.<br>♦ ශිෂ්‍ය පාර්ලිමේන්තුව පැවැත්වීම පිළිබඳව තෝරා ගත් කලාපවල විදුහල්පතිවරු හා ගුරුවරු මැතිවරණ කොමිසමේ ද සහාය ඇතිව දැනුම්වත් කිරීම. |
| ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය | ♦ සමස්ත ලංකා ක්‍රීඩා උළෙල හා සමස්ත ලංකා සහාය දීවීමේ තරඟාවලිය පැවැත්වීම.<br>♦ ක්‍රීඩා ගුරු පුහුණු අත්පොත් 07ක් සකස් කර මුද්‍රණය කිරීම.<br>♦ කලාප ක්‍රීඩා සම්බන්ධීකරණ නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා ගුරුවරු පුහුණු කිරීම.<br>♦ ක්‍රීඩා පාසල් 21ක අධ්‍යාපනය ලබන ක්‍රීඩා දක්ෂතා සහිත සිසුන් 750දෙනෙකුට ආහාර පාන සඳහා දීමනා ලබා දීම.<br>♦ ක්‍රීඩා පුහුණුකරුවන් 3,888 දෙනෙක් පාසල් පද්ධතියට බඳවා ගැනීම, පුහුණු කිරීම හා ස්ථානගත කිරීම. |
| සෞන්දර්යය අධ්‍යාපනය | ♦ පෙරදිග සංගීතය, බටහිර සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලාව හා චිත්‍ර විෂය ගුරුවරුන්ගේ, ගුරු උපදේශකවරුන්ගේ සහ විෂයභාර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.<br>♦ “රාග් සාවන්”, “රාග් ගයාන්”, “රාග් වලන්” ප්‍රසාංගික වැඩසටහන් ගුරු සිසු දෙපාර්ශවයේම සහභාගිත්වයෙන් පැවැත්වීම.<br>♦ සමස්ත ලංකා පාසල් සෞන්දර්යය තරඟ පැවැත්වීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය** | |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල තත්වය ඉහළ නැංවීම | ♦ 2019 වසරේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා නවක ගුරු සිසුන් 6448ක් බඳවා ගැනීම.<br>♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ උපාධි ප්‍රදාන ආයතන බවට උසස් කිරීම සඳහා වූ යෝජනාව සකස් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් හඳුනා ගැනීම. |
| පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD) | ♦ සියලුම පාසල්වල පාසල් පාදක ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් සහිත පාසල් පාදක ගුරු සංවර්ධන චක්‍රලේඛය බෙදා හැරීම.<br>♦ පාසල් පාදක ගුරු සංවර්ධන උපදෙස් සංග්‍රහය මුද්‍රණය කිරීම. |
| ජාතික ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය සහ ගුරු කළමනාකරණය | ♦ ගුරු පුහුණුව සඳහා අංග සම්පූර්ණ ගුරු මධ්‍යස්ථාන ලබාදීම යටතේ ඉදිකිරීම් ආරම්භ කළ නව දෙමහල් ගුරු මධ්‍යස්ථාන 39න් 30ක ඉදිකිරීම් අවසන් කිරීම.<br>♦ ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නියමිත මොඩියුල 20ක පුහුණුව ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන හරහා සියලුම කලාප කාර්යාල ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම :- ගුරුවරුන් 50,894ක් පමණ මෙම මොඩියුල පුහුණුව හරහා පුහුණු වී කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්ව ඇත.<br>♦ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය යටතේ නුපුහුණු ගුරුවරුන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා ගුරු විද්‍යාලවලට නුපුහුණු ගුරුවරුන් 691ක් බඳවා ගැනීම.<br>♦ සති අන්ත ගුරු පුහුණු පාඨමාලා සඳහා ගුරුවරු 747ක් බඳවා ගෙන පුහුණු කිරීම.<br>♦ 2019 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වූ අඛණ්ඩ ගුරු වෘත්තීය වැඩසටහන යටතේ ඉංග්‍රීසි, ගණිතය, ජාතික භාෂා, දෙවන ජාතික භාෂා, සමාජ විද්‍යා විෂයයන්, තොරතුරු තාක්ෂණය, විද්‍යාව හා ප්‍රාථමික ගුරුවරු සඳහා විෂයානුබද්ධ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>♦ **නව ගුරුවරු බඳවා ගැනීම - 2019** |

| ගුරු වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| නැගෙනහිර පළාතේ ස්වේච්ඡා ගුරුවරු ගුරු සේවයට බඳවා ගැනීම | 762 |
| උතුරු පළාතේ ස්වේච්ඡා ගුරුවරු ගුරු සේවයට බඳවා ගැනීම | 380 |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම | 4286 |
| සංවර්ධන සහකාර, මූල්‍ය සහකාර, සංවර්ධන නිලධාරී ගුරු සේවයට බඳවා ගැනීම | 592 |
| 13 වසරක අධ්‍යාපන වැඩසටහන යටතේ වෘත්තීය විෂයයන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම | 1234 |
| **එකතුව** | **7,254** |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය** | |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය | ♦ දෘඩාංග හා ජාලකරණ විසඳුම්, අන්තර්ජාල භාවිතය, e - ඉගෙනුම් ක්‍රියාවලිය සම්බන්ධව ගුරුවරු පුහුණු කිරීම.<br>♦ ආරක්ෂිතව අන්තර්ජාල භාවිතය සම්බන්ධව විදුහල්පතිවරු 182ක් පුහුණු කිරීම.<br>♦ පරිගණකය ඉගෙනුම් උපකරණයක් ලෙස භාවිතය පිළිබඳව ගුරුවරු පුහුණු කිරීමට මෙඩියුල 03ක් සැකසීම හා පුහුණුකරුවන් 150ක් පුහුණු කිරීම.<br>♦ පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානවල මෘදුකාංග සංවර්ධන කණ්ඩායම් හා ගුරුවරුන්ගෙන් සමන්විත 25දෙනෙකු සඳහා විදේශ පුහුණුව ලබාදීම.<br>♦ ප්‍රාථමික ශ්‍රේණි, 6-11 ශ්‍රේණි සහ 12-13 ශ්‍රේණි සඳහා ඊ- විෂය සංදර්භය (e -Content) සංවර්ධනය කිරීම.<br>♦ KOICA ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අධ්‍යාපන මෘදුකාංග සංවර්ධනය සඳහා National Content Development Centre ආයතනය ස්ථාපිත කිරීමට අදාළ ගිවිසුම් අත්සන් කිරීම හා මූලික සැලසුම් සකස් කිරීම. |
| **පාසල් නගා සිටුවීමේ වැඩසටහන හරහා පාසල් බල ගැන්වීම.** | |
| පාසල් නගා සිටුවීමේ වැඩසටහන සවිබල ගැන්වීම | ♦ පාසල් නගා සිටුවීමේ වැඩසටහන තවදුරටත් උසස් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛ සංශෝධනය කිරීම, පළාත් සමග සැලසුම් සකස් කිරීම සහ නියාමන යාන්ත්‍රණයක් සකස් කිරීම. |
| පාසල් මූල්‍යකරණය විමධ්‍යගතකරණය | ♦ 26/2018 දරණ පාසල් පාදක ගුණාත්මක ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොත අවශ්‍ය සංශෝධන සිදුකරමින් නැවත අංක 19/2019 යටතේ 2019.04.09 දින නිකුත් කිරීම. |
| **ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | |
| පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම | ♦ පාසල් ඇගයීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය සහ පුහුණු අත්පොත පිළියෙල කිරීම සහ ඇගයුම්කරුවන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් 100ක් පුහුණු කිරීම.<br>♦ GEMP ව්‍යාපෘතිය යටතේ පාසල් ඇගයීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව විදුහල්පතිවරු 1000ක් හා නිලධාරීන් 103ක් දැනුම්වත් කිරීම.<br>♦ පාසල්වල යහපත් ව්‍යවහාර හඳුනා ගැනීම සඳහා වැඩසටහන් 10ක් ක්‍රියාත්මක කර යහපත් ව්‍යවහාර 324ක් හඳුනා ගැනීම.<br>♦ ගුරු කාර්යසාධනය ඇගයීම සහ ගුරු නිපුණතා සංවර්ධනය සඳහා ගුරු නිපුණතා රාමුව සකස් කිරීම.<br>♦ පාසල් ඇගයීම් ප්‍රතිඵල මත විශේෂ සහාය අවශ්‍ය පාසල් 30ක් හඳුනා ගෙන එම පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය සහාය ලබා දීම.<br>♦ පාසල් සුපරීක්ෂණ සේවය සඳහා සංකල්ප පත්‍රිකාව සහ මාර්ගෝපදේශ සකස් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **පාසල්,කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම** | |
| පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම | ♦ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 111 ශ්‍රේණියට නවක විදුහල්පතිවරුන් 1858දෙනෙක් බඳවා ගැනීම හා පුහුණු කිරීම.<br>♦ පාසල් නායකත්ව සහ කළමනාකරණ ජාතික නිපුණතා රාමුවේ මූලික විදුහල්පති පාඨමාලාව යටතේ විදුහල්පතිවරු 829ක් පුහුණු කිරීම.<br>♦ කලාප හා කොට්ඨාශ අධ්‍යාපන නිලධාරීන් 50ක් සඳහා විදේශ පුහුණුව ලබා දීම.<br>♦ අධ්‍යාපන පරිපාලන සේවය ,විදුහල්පති සේවය ඇතුළු අධ්‍යාපන කාර්යමණ්ඩල නිලධාරීන් 480ක් සඳහා කෙටිකාලීන පුහුණුව ලබා දීම.<br>♦ GEMP ව්‍යාපෘතිය යටතේ විදේශීය පශ්චාත් උපාධි පාඨමාලා ලබා දීම සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ගුරු අධ්‍යාපනඥ සේවයේ හා විෂය මාලා සංවර්ධන නිලධාරීන් 101ක් සම්මුඛ පරීක්ෂණ මඟින් තෝරා ගැනීම. |
| **සාක්ෂි පදනම් කර ගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය,පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම.** | |
| සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම | ♦ නව අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කර පාර්ලිමේන්තුවේ නීති කෙටුම්පත් අංශයට ඉදිරිපත් කිරීම.<br>♦ 2020- 2030 කාල පරිච්ඡේදය සඳහා මධ්‍යකාලීන අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීම.<br>♦ ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) යටතේ වන ගුරු තොරතුරු පද්ධතිය (THRM)යාවත්කාලීන කිරීම - : 2019 වර්ෂය අවසන් වන විට ගුරුවරුන් 250,375කගේ තොරතුරු ඇතුළත් කර තිබිණි.<br>♦ NEMIS තොරතුරු පද්ධතිය යටතේවන ශිෂ්‍ය තොරතුරු පද්ධතිය (SIS) යාවත්කාලීන කිරීම සඳහා පළාත්වලට අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම.<br>♦ රජයේ පාසල්වල ගුරු කාර්ය මණ්ඩල නිර්ණය කිරීම සඳහා වන 1/2016 චක්‍රලේඛය සංශෝධනය කිරීම.<br>♦ ගෝලීය තොරතුරු පද්ධතියට (GIS)අධ්‍යාපන ආයතන පිහිටි ස්ථාන ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය දිස්ත්‍රික් 16ක අවසන් කිරීම. |
| අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය | ♦ අධ්‍යාපන පර්යේෂණවල නියැලෙන අධ්‍යාපන වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.<br>♦ අධ්‍යාපන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ මධ්‍යම, බස්නාහිර හා වයඹ පළාත්වල පර්යේෂණ සඳහා ප්‍රතිපාදන ලබා දීම.<br>♦ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පර්යේෂණ ක්‍රම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගත් නිලධාරීන් 80 දෙනෙකු වෙනුවෙන් පාඨමාලා ගාස්තු ගෙවීම. |

<table>
<tr><th>ක්ෂේත්‍රය</th><th>ළඟා කර ගත් ප්‍රගතිය</th></tr>
<tr><td colspan="2">නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහතික කිරීම</td></tr>
<tr><td>ශිෂ්‍ය සුභසාධන සේවා ශක්තිමත් කිරීම</td><td>
♦ රජයේ පාසල්, අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ඉගෙනුම ලබන මි.4.2ක් පමණ වන සිසුන් සඳහා රු.440, රු.425 රු.580, රු 845, රු730, රු.745,රු.795 රු850, රු1065, රු1375, රු.1800 ලෙස කාණ්ඩ 11ක් යටතේ පාසල් නිල ඇඳුම් තිලිණපත් ලබා දීම.<br><br>
♦ රජයේ පාසල්, අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ඉගෙනුම ලබන මි.4.2ක් පමණ වන සිසුන් සඳහා පෙළ පොත් ලබාදීම.<br><br>
♦ දුෂ්කර හා අතිදුෂ්කර වර්ගීකරණය යටතේ තෝරා ගත් පාසල් 4,690ක සිසුන්ට රු.1,200, රු.1,300, රු.1,400, සහ රු.1,500 යන කාණ්ඩ 04 යටතේ පාවහන් තිලිණ පත් ලබා දීම.
</td></tr>
<tr><td>පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම</td><td>
<table>
<tr><th>ලබා දෙන ශිෂ්‍යත්වය</th><th>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</th></tr>
<tr><td>සුභග ශිෂ්‍යත්වය 2019</td><td>887</td></tr>
<tr><td>5 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යාධාර</td><td>72,000</td></tr>
<tr><td>මහත්මා ගාන්ධි ශිෂ්‍යත්වය</td><td>150</td></tr>
<tr><td>තාක්ෂණවේදය ශිෂ්‍යත්වය</td><td>750</td></tr>
<tr><td>සුජාත දියණි ශිෂ්‍යත්වය</td><td>250</td></tr>
</table>
</td></tr>
</table>

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|
| **පාසල් පද්ධතිය තුළ සුරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම (ළඟ ම පාසල හොඳ ම පාසල ව්‍යාපෘතිය)** | | | |
| | **ලබාදුන් භෞතික සම්පත්** | **2016 - 2019** | |
| මැත කාලීනව කිසිදු ව්‍යාපෘතියකට අයත් නොවූ අ.පො.ස. (උ.පෙළ) සහිත පාසල් 1,360ක් පමණ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | **නව ඉදිකිරීම්** | **ආරම්භ කළ සංඛ්‍යාව** | **අවසන් කළ සංඛ්‍යාව** |
| | ආපනශාලා | 53 | 37 |
| | ක්‍රීඩා සංකීර්ණ | 7 | 2 |
| | කණිෂ්ඨ ද්විතියික විද්‍යාගාර | 240 | 163 |
| | ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | 419 | 336 |
| | තාක්ෂණ ගොඩනැගිලි | 255 | 173 |
| | **ගොඩනැගිලි අලුත්වැඩියා** | | |
| | අලුත්වැඩියා කාර්යයන් | 886 | 783 |
| | ජාතික පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදිකිරීම් | 528 | 291 |
| | ඉහත ගොඩනැගිලි සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම | | |
| ද්විතියික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | පන්තිකාමර ගොඩනැගිලි | 343 | 236 |
| | ගුරු නේවාසිකාගාර | 104 | 80 |
| | විදුහල්පති නිල නිවාස | 162 | 132 |
| | සෞන්දර්ය ඒකක | 25 | 20 |
| | ගොඩනැගිලි අලුත්වැඩියා | 1030 | 838 |
| | ජාතික පාසල්වල අලුත්වැඩියා හා ඉදිකිරීම් | 1069 | 696 |
| | ඉහත ගොඩනැගිලි සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම | | |
| ප්‍රාථමික පාසල් 3,577ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය | 401 | 328 |
| | ගොඩනැගිලි අලුත්වැඩියා | 2497 | 2360 |
| | ඉහත ගොඩනැගිලි සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම | | |
| සියලුම පාසල්වලට විදුලිබල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | විදුලිබල පහසුකම් සැපයීම හා වැඩි දියුණු කිරීම | 2613 | 2168 |
| සියලුම පාසල්වලට ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | ජල පහසුකම් සැපයීම හා වැඩි දියුණු කිරීම | 773 | 640 |
| සියලුම පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | සනීපාරක්ෂක පහසුකම් සැපයීම හා වැඩි දියුණු කිරීම | 3796 | 3440 |
| ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවලට ප්‍රමුඛත්වය ගුරු නිල නිවාස, පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නව ගුරු නිවාස ඉදිකිරීම | 254 | 217 |
| වතුකරයේ පාසල් 25ක් ද්විතියික මට්ටමට උසස් කිරීමේ ව්‍යාපෘතිය | නව ගොඩනැගිලි ඉදිකිරීම | 36 | 25 |
| පාසල්වල දන්ත සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | නව දන්ත සායන ඉදිකිරීම් | 18 | 14 |
| | දන්ත සායන අලුත්වැඩියා | 122 | 100 |

## 2.1.2 ශිෂ්‍ය කාර්ය සාධනය

### (අ) පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2015 – 2019)**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 333,672 | 343,757 | 350,462 | 350,191 | 332,179 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 76.33 | 75.67 | 69.40 | 79.09 | 78.10 |
| මධ්‍යන්‍ය ලකුණ | 109.50 | 107.86 | 106.43 | 117.98 | 114.38 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2015 – 2019)**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

### (ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2015 – 2019)**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 273,224 | 286,251 | 296,812 | 296,029 | 305,427 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 189,428 | 200,208 | 216,815 | 222,281 | 225,539 |
| සමත් ප්‍රතිශතය % | 69.3 | 69.9 | 73.0 | 75.1 | 73.84 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව




මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## (ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2015-2019**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 (නව නිර්දේශය) | 2019 (පැරණි නිර්දේශය) |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 210,340 | 211,865 | 206,630 | 218,191 | 173,781 | 61,769 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව | 131,137 | 134,238 | 136,421 | 141,172 | 108,353 | 46,552 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 62.35 | 63.36 | 66.02 | 64.70 | 62.35 | 75.36 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

**එක් එක් විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (2016 -2019)**






















මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

## 2.2 පවත්නා අභියෝග

අධ්‍යාපන පද්ධතිය තුළ පවත්නා අභියෝග අතර ප්‍රධානතම අභියෝගයක්ව ඇත්තේ අතිශයින්ම විභාග කේන්ද්‍රීය පාසල් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වීමයි. දැනුම පමණක් මැනෙන විභාග ක්‍රමයක් තුළින් ලබන ජයග්‍රහණ මත සිසුන්, ගුරුවරු මෙන්ම පාසල් ඇගයීමට ලක් වීම, එම විභාග ප්‍රතිඵල මත ඉහළ ලකුණු ලබා ගන්නා සිසුන්ගෙන් සීමිත පිරිසකට පමණක් උසස් අධ්‍යාපන අවස්ථා හිමිවීම ආදී කරුණු මත 21වන සියවසේ ජීවත්වීම සඳහා පුරවැසියෙකුට අවශ්‍ය නිපුණතා දායාද කිරීමේ කාර්යය පාසල තුළ අභියෝගයට ලක් ව තිබේ. 21 වන සියවසට ඔබින කුසලතා සිසුන් තුළ ජනිත කරවන නව විෂයමාලාවක අවශ්‍යතාව මෙහිදී අවධානයට ලක් කළ යුතුව ඇත. ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රායෝගික විෂයමාලාවක් හඳුන්වාදීම, ඇගයීම් ක්‍රමවේද වෙනස් කිරීම,ශිෂ්‍යයින් වැඩිපිරිසකට උසස් අධ්‍යාපන අවස්ථා හිමි කිරීම ආදී ක්‍රමෝපායන් තුළින් මෙම අභියෝගයට මුහුණ දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත.

සිසුන් තුළ නිපුණතා සංවර්ධනය සඳහා ප්‍රධානතම භූමිකාව ඉටු කරන ගුරුවරයා සම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලින් බැහැර කොට ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ක්‍රමවේදයන්ට යොමු කිරීම අප හමුවේ ඇති තවත් අභියෝගයකි. ගුරු වෘත්තිය උසස් මට්ටමේ වෘත්තියක් ලෙස සංවර්ධනය කිරීම හා දක්ෂ ගුරුවරු පාසල් පද්ධතියට එක් කර ගැනීම සඳහා ආකර්ෂණීය වෘත්තියක් බවට පත් කිරීම අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතු කාර්යයක්ව පවතී. අඛණ්ඩ ගුරු අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ගුරු අධ්‍යාපන විෂයයමාලා යාවත්කාලීන කිරීම, ගුරු අධ්‍යාපනඥ සේවය බල ගැන්වීම ආදී ක්‍රමෝපායන් රැසක් තුළින් ගුරු භූමිකාව වර්තමානයට ගැලපෙන පරිදි සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කර ඇත.

පාසල් පද්ධතිය තුළ විවිධ හේතු මත ගොඩනැගී ඇති විෂමතා හේතුවෙන් හොඳ පාසලකට දරුවා ඇතුළත් කර ගැනීම සඳහා දෙමව්පියන් තුළ ඇති තරඟකාරීත්වය මත අධ්‍යාපන පද්ධතිය තුළ අභියෝග රැසක් මතුව ඇත.දරුවන්ගේ පෝෂණය පිළිබඳ අවධානය අඩුවීම, ක්‍රියාකාරකම් සඳහා කාලය අඩුවීම, පෞද්ගලික උපකාරක පන්ති යැවීම තුළින් දරුවා දැඩි වෙහෙසට පත් කිරීම ආදී ගැටලු මෙන්ම ආයතනික වශයෙන් ද මේ හා සම්බන්ධ අභියෝග රැසක් මතුව ඇත. මීට පිළියම් ලෙස පාසල් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් හරහා පාසල් ජාලගත කර සියලුම සිසුන්ට උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලැබෙන පරිදි පාසල් සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සැලසුම් කරනු ලැබ ඇත.

සමස්තයක් ලෙස පාසල් පද්ධතිය තුළ ශිෂ්‍ය ගුරු අනුපාතය 17:1ක් ලෙස ප්‍රශස්ත අගයක පවතින නමුත් විෂයය අනුව හා පාසල් අනුව ගුරු හිඟයන් පැවතීම විශාල ගැටළුවක් ව පවතී. ගුරුවරු බඳවා ගැනීමේ ස්වභාවය, ගුරුවරු ස්ථානගත කිරීමේ ක්‍රමවේද හා ගුරු මාරු සම්බන්ධව පවතින ගැටළු ආදිය හේතුවෙන් දුෂ්කර ප්‍රදේශවල පාසල් ගුරු හිඟයක් පවතින අතර ඒ සමග ම නාගරික ප්‍රදේශවල පාසල්වල ගුරු අතිරික්තයක් පවතී. මෙම ගැටළුවට පිළියමක් ලෙස ගුරු වැටුප් වැඩි කිරීම සඳහා සංවෘත සේවාවක් ක්‍රියාත්මක කිරීම, දුෂ්කර ප්‍රදේශවල ගුරුවරු දිරිමත් කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම වැනි ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කර ඇත.

## 2.3 ඉදිරි ඉලක්ක

### 2.3.1 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

"සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්තියේ "ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්" යන කොටසෙහි දක්වා ඇති සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට අදාළ පහත දැක්වෙන ප්‍රතිපත්තීන් යටතේ වූ ක්‍රියාකාරකම් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ.මේ සඳහා දැනටමත් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ කාර්යසාධන බලකායක් ස්ථාපනය කර ඇති අතර, එමගින් මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් නිර්දේශ කර ඇත.

1. **නිදහස් අධ්‍යාපන අයිතීන් තවදුරටත් සුරක්ෂිත කිරීම**
   නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වාර්ෂික ප්‍රතිපාදන යටතේ අග්‍ර ප්‍රමුඛතාවයක් පිරිනැමීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.(උදා- නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම, නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී)

2. **ජාතික පාසල් 1000 වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**
   සියලුම භෞතික හා මානව පහසුකම්වලින් සම්පූර්ණ පාසල් 3 බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පිහිටුවා ඒවා ජාතික පාසල් ලෙස උසස් කර, ජාතික පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා වැඩි කිරීමටත්, එම ජාතික පාසල් ප්‍රමුඛ කොට පාසල් ජාලයක් නිර්මාණය කිරීමෙහි මූලික ප්‍රතිපත්තිමය කාර්යයන් මේ වන විටත් ආරම්භ කර ඇත.

   - මෙය I හා II ලෙස අදියර දෙකකින් සමන්විත අතර, I අදියරේ දී කිසිඳු ජාතික පාසලක් නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ජාතික පාසලක් බැගින් පාසල් 125ක් සංවර්ධනයට සැලසුම් කර ඇත. මේ වන විට අදාළ පාසල් 125ම හඳුනා ගෙන ඇත.
   - II අදියරේ දී ඉතිරි පාසල් 503, පාසල් සිතියම්කරණය තුළින් හඳුනා ගෙන සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

3. **ත්‍රෛභාෂික, අග්‍රගණ්‍ය සුපිරි ජාතික පාසල් 20ක් දිස්ත්‍රික්ක 20ක් ආවරණය වන පරිදි ස්ථාපිත කිරීම ආරම්භ කිරීම.**

4. **විශ්ව විද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේ ලකුණු ක්‍රමයේ මධ්‍ය අංකනය හෙවත් (Z-Score) සඳහා දිස්ත්‍රික්ක පදනම වෙනුවට, පාසල් පදනම් වූ නව විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව කටයුතු කිරීම.**

   මෙහි දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යයන් 2020 වර්ෂයේ දී ඉටු කිරීමට අපේක්ෂිත වේ.
   - මේ සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම.
   - පහසුකම් පාදකව පාසල් වර්ගීකරණයක් සිදු කිරීම.
   - පාසල් වර්ගීකරණය හා ශිෂ්‍ය සාධනය අතර සම්බන්ධතාවය පිරික්සීම සඳහා විශ්ලේෂණයක් සිදු කිරීම.
   - දැනට විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ සමාලෝචනය කිරීම හා නව ක්‍රමවේදයක් යෝජනා කිරීම.

5. **ශ්‍රී ලංකාවේ සමස්ත ගුරු ප්‍රජාවම උපාධිධාරීන් බවට පත් කිරීම අරමුණු කර ගනිමින්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ලෙස පවත්වා ගෙන යන පීඨ 9ක් උපාධි ලබා දෙන විශ්ව විද්‍යාල පීඨ බවට පත් කිරීම.**
   - ජාතික අධ්‍යාපන ආයතනය, උපාධි ලබා දෙන ආයතනයක් බවට පත් කිරීම පිළිබඳ යෝජනාව නැවත සමාලෝචනය කිරීම.
   - සියලුම පීඨවල තිබෙන භෞතික හා මානව සම්පත් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම.
   - විද්‍යාපීඨ සංවර්ධනය කිරීම සඳහා වසර 04ක සැලසුම් සකස් කිරීම.
   - ජාතික අධ්‍යාපන ආයතනයේ සහ විද්‍යාපීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනයට ක්‍රමවේදයක් සකස් කිරීම.

6. **අධ්‍යාපන සේවාවන්ට අදාළව සංවෘත සේවාවක් පිහිටුවීම.**
   - දැනට පවතින අධ්‍යාපන සේවා පිළිබඳ පුළුල් අධ්‍යයනයකින් පසුව, සංවෘත සේවාවක් පිහිටුවීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීම.

7. **සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම.**
   - සාමාන්‍ය අධ්‍යාපනය ලබාදෙන පාසල් ලෙස ලියාපදිංචි නොවූ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.
   - ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තීන්ට අනුව ක්‍රියාත්මකවන පාසල් බවට මෙම පාසල් සංවර්ධනය හා නියාමනයට කටයුතු කිරීම.
   - මෙම පාසල්වල අධ්‍යාපනය හදාරණ දරුවන් ද පාසල් කටයුතු (පාසල් ක්‍රීඩා, සංස්කෘතික කටයුතු, ප්‍රදර්ශන ආදී) සහභාගීවීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.
   - මෙම පාසල්වල ඉගෙන ගන්නා සිසුන්ට අවශ්‍ය අවස්ථාවල ද රජයේ පාසල්වලට හා විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීමට හැකිවන ක්‍රමවේදයක් සකස් කිරීම.

8. **විෂයමාලා සංවර්ධනය, ගුරු පුහුණුව සහ පාසල් සඳහා යටිතල පහසුකම් සහ උසස් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ පහසුකම් සැලසීම.**
   - විභාග කේන්ද්‍රීය ක්‍රමවේදයක් වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීම.
   - දරුවන්ගේ කුසලතා ඉහළ නැංවීම සඳහා සහ 21 වන ශතවර්ෂයටත්, දැනුම් ආර්ථිකයටත් ගැළපෙන පරිදි හා තිරසර ලෙස විෂයමාලා රාමුව සකස්වී ඇති ද යන්න පිළිබඳව සමාලෝචනය හා විෂයමාලා රාමුව සකස් කිරීම.

9. **පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය**
   - පෙර පාසල් විෂය මාලාවේ දැනට තිබෙන තත්වය අධ්‍යයනය
   - පෙර පාසල් අධ්‍යාපනය දරුවන්ගේ සංවර්ධනයේ ප්‍රමුඛ අවධියක්වන බැවින් ඒ පිළිබඳ අදාළ මාර්ගෝපදේශ සකස් කිරීම.
   - පෙර පාසල් විෂයමාලා රාමුවක් සකස් කිරීම.
   - පෙර පාසල් ගුරුවරුන්ගේ සුදුසුකම් රාමුව පිළිබඳව මාර්ගෝපදේශයක් සංවර්ධනය කිරීම.
   - පෙර පාසල්, ගුරු පුහුණුව පිළිබඳ ජාතික මට්ටමේ නිර්දේශ ලබාදීම.
   - වයස අවුරුදු 3-4 වයසේ දරුවන් සඳහා පෙර පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් නිර්දේශ කිරීම.

10. **ප්‍රාථමික අධ්‍යාපනය**
    - දරුවන්ගේ වර්ධනය හා සංවර්ධනය ප්‍රතිපත්ති / මූලධර්මවලට අදාළව: ප්‍රාථමික විෂයමාලාව සහ එහි නිපුණතා අධ්‍යයනය කිරීම.(21 වන ශතවර්ෂයේ කුසලතා, සෞඛ්‍ය සහ ශාරීරික යෝග්‍යතාව, භාෂා නිපුණතාව, ගණිත හැකියාව, පාරිසරික ආරක්ෂාව පිළිබඳව, පිරිසිදු ශක්තීන් සහ ස්වාභාවික සම්පත් පරිභෝජනය, බහු සංස්කෘතික දැක්ම, සමාජ අගයයන් සහ ජීවන කුසලතා.)
    - තක්සේරුකරණ හා ඇගයීමේ ක්‍රමවේදය නවීකරණය.

11. **විෂයමාලා සංවර්ධනය (කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශයේ විෂයමාලාව)**
    - දරුවන් තුළ 21වන ශතවර්ෂයේ කුසලතා ඔප්නැංවෙන පරිදි ශිෂ්‍ය පාදක ලෙස විෂයමාලාව සංශෝධනය කිරීම.
    - විෂයමාලා නවීකරණය හා විවිධාංගීකරණය

12. **ගුරු අධ්‍යාපනය හා වෘත්තීය සංවර්ධනය**
    - ගුරු අධ්‍යාපන විෂයමාලාව නවීකරණය කිරීම හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා ගුරුවරුන්ට අවස්ථා ලබා දීම.
    - පූර්ව සේවා ගුරු පුහුණුවේදී, අධ්‍යාපනවේදී උපාධියක් ලබා ගත හැකි පරිදි ගුරු අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල ආයතන ලෙස උසස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

**13. තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය සහ මාධ්‍ය තාක්ෂණය, අධ්‍යාපනය සඳහා යොදා ගැනීමට පියවර ගැනීම.**

- සියලුම දරුවන් සඳහා තොරතුරු තාක්ෂණ ඥානය ලබා ගත හැකි පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම හා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පියවර ගනු ලැබේ.

**14. සෞඛ්‍ය, පෝෂණ, ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.**

**15. සෞන්දර්ය කුසලතා දරුවන් තුළ සංවර්ධනය කිරීම සඳහා පියවර ගැනීම.**

**16. ඉංග්‍රීසි අධ්‍යාපනය සංවර්ධනය සඳහා පියවර ගැනීම**

- විශේෂයෙන්ම ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම නවීකරණය කිරීමට පියවර ගනු ලැබේ.

### 2.3.2 සාමාන්‍ය අධ්‍යාපන මධ්‍යකාලීන සැලැස්ම තුළ අන්තර්ගත වැඩසටහන්

"සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්තියේ යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අමතරව, සාමාන්‍ය අධ්‍යාපන මධ්‍යකාලීන සැලසුම් තුළ අන්තර්ගත පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ද, ඉදිරි වසර 5ක කාලය තුළ සාමාන්‍ය අධ්‍යාපනයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

**1. අධ්‍යාපනයේ සම සාධාරණත්වය ශක්තිමත් කරමින් සියලුම දරුවන් සඳහා සම සාධාරණ අධ්‍යාපන අවස්ථා ලබා දීම.**

**13 වසරක සහතික කරන ලද අධ්‍යාපනය**

අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ නොසලකා, සියලුම දරුවන්ට උසස් පෙළ සඳහා ඇතුළත් විය හැකි පරිදිත්, කිසිදු වෘත්තීය කුසලතාවයකින් තොරව පාසල් පද්ධතියෙන් ඇදහැලෙන දරුවන් සඳහා වෘත්තීය කුසලතා ලබා ගත හැකි පරිදි වෘත්තීය විෂයයන් 26කින් යුතු විෂයමාලාව උසස් පෙළ සඳහා හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන, ශ්‍රී ලංකාවේ අනාගත ප්‍රතිපත්තීන් හා මෙම විෂයයන්ගේ වලංගුතාවයන් සලකා බලා විශ්ලේෂණය කර නවීකරණය තුළින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- නිදහස් / නොමිලේ අධ්‍යාපනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පියවර ගැනීම.
- ප්‍රාථමික හා ද්විතීයික අංශයේ දරුවන් සඳහා සම සාධාරණ ඉගෙනුම් ප්‍රවේශ ලබා දීම සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආරක්ෂිත හා ආකර්ශණීය ඉගෙනුම් පරිසරයක් පාසල් තුළ ඇති කිරීම සඳහා පියවර ගැනීම.
- වෘත්තීය මාර්ගෝපදේශය සහ උපදේශන වැඩසටහන් ශක්තිමත් කිරීම.

**2. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම**

- විෂයමාලා නවීකරණය හා විවිධාංගීකරණය
- විද්‍යා, තාක්ෂණ, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සංවර්ධනය සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඩිජිටල් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීම සංවර්ධනය කිරීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම් සංවර්ධනය.
- දරුවන්ගේ පරිවර්තීය කුසලතා (Transversal Skills), මනෝ සමාජීය කුසලතා (Socio-emotional skills), අගනාකම් (Values) සහ ආචාරධර්ම (ethics) සංවර්ධනය කිරීම සඳහා මූලිකත්වය ලබා දීම.
- ගුරු අධ්‍යාපනය, ගුරු සංවර්ධනයසහ ගුරු කළමනාකරණය වඩාත් ඵලදායීව සිදු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ශිෂ්‍ය තක්සේරුකරණය සහ ඇගයීම් ක්‍රමවේද තවදුරටත් වැඩිදියුණු කිරීම.
- වඩාත් ආකරශණීය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හිතකර ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉගෙනුම් ඵල තවදුරටත් ඉහළ නැංවීම.

### 3. අධ්‍යාපනයේ හිමිකාරීත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම

- පාසල් අධීක්ෂණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම මගින් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- පාසල් පාදක කළමනාකරණය ශක්තිමත් කිරීම තුළින් පාසල් සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය සඳහා තවදුරටත් දායකත්වය ලබා දීම.
- කලාප, කොට්ඨාස, පළාත් සහ ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.
- වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 4. සාක්ෂි මත පදනම්ව අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම සහ අධ්‍යාපන සැලසුම්කරණය

- අධ්‍යාපන පර්යේෂණ, ප්‍රතිඵල-පාදක නියාමනය සහ ඇගයීම් සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම හා සැලසුම්කරණය ශක්තිමත් කිරීම.
- අධ්‍යාපනික ජයග්‍රහණ සම්බන්ධව මහජනතාව දැනුම්වත් කිරීම.

| NSBS වැඩසටහන යටතේ B සහ C ව්‍යාපෘතිවලට අයත් පාසල්වල විෂය සමගාමී නියෝජ්‍ය විදුහල්පතිවරු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන | නියෝජ්‍ය විදුහල්පතිවරු 300 ක් | දින 4බැගින් වැඩසටහන් 11ක් | 6.24 | | පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම හා කුසලතාව |
| පළාත් හා කලාප විෂය සමගාමී සම්බන්ධීකාරක නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන | සම්බන්ධීකාරක නිලධාරීන් 26ක් | දෙදින වැඩසටහන් 1ක් | 0.31 | | පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම හා කුසලතාව |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| අ.පො.ස (උ/පෙළ) නාට්‍ය හා රංග කලා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පරීක්ෂකවරුන් පුහුණුව | පරීක්ෂකවරුන් 167ක් | වැඩසටහන් 2ක් | 0.22 | | නාට්‍ය හා රංග කලා ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ දැනුම |
| උ/පෙළ නාට්‍ය හා රංග කලා ගුරුවරු සඳහා නාට්‍ය හා රංග කලා විෂය වැඩමුළුව | ගුරුවරු 240ක් | වැඩසටහන් 3ක් | 0.91 | | නාට්‍ය හා රංග කලා ඉගැන්වීම පිළිබඳ දැනුම හා කුසලතාව |
| සබරගමු පළාතේ සා/පෙළ හා උ/පෙළ චිත්‍ර ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | ගුරුවරු 127 ක් | එක් වැඩසටහන් | 0.27 | | සා/පෙළ හා උ/පෙළ චිත්‍ර විෂයය ඉගැන්වීම පිළිබඳ දැනුම හා කුසලතාව |
| චිත්‍ර කලා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | නිලධාරී 72ක් | එක් වැඩසටහන් | 0.08 | | චිත්‍ර විෂයය ඉගැන්වීම පිළිබඳ දැනුම හා කුසලතාව |
| අ.පො.ස සා/පෙළ, උ/පෙළ චිත්‍ර ගුරුවරුන් සඳහා චිත්‍ර සංරචනය හා ග්‍රැෆික් ප්‍රායෝගික වැඩමුළුව | ගුරුවරුන් 215ක් | වැඩසටහන් 4ක් | 0.65 | | අ.පො.ස සා/පෙළ, උ/පෙළ චිත්‍ර සංරචනය හා ග්‍රැෆික් ප්‍රායෝගික දැනුම |
| **ජාතික ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය සහ ගුරු කළමනාකරණය** | | | | | |
| ගුරු විද්‍යාල මගින් බඳවාගත් ගුරුවරු සඳහා ගුරු පුහුණු පාඨමාලාව | ගුරුවරු 747ක් | එක් පාඨමාලාවක් | 25.3 | | විෂයය හා වෘත්තීය දැනුම |
| ගුරු කාර්යක්ෂමතා විභාග සඳහා අදාළ මොඩියුල 20 පිළිබඳ ගුරු පුහුණුව | ගුරුවරු 50,894ක් | වැඩසටහන් 1020 ක් | 39.43 | | විභාගයට අයත් විෂයයන්ගේ දැනුම |
| ජාතික අධ්‍යාපන ආයතනය හරහා සති අන්ත ගුරු පුහුණු පාඨමාලා | | එක් වැඩසටහනක් | 9.00 | | වෘත්තීය දැනුම |
| **ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය** | | | | | |
| දෘඩාංග හා ජාලකරණ විසඳුම් සම්බන්ධව ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | ගුරුවරුන් 120ක් | එක් දින වැඩසටහන් 3ක් | 1.77 | | දෘඩාංග හා ජාලකරණ විසඳුම් සම්බන්ධ දැනුම හා කුසලතාව |
| අන්තර්ජාලය, ඊ- ඉගෙනුම්, තොරතුරු තාක්ෂණ භාවිතය සම්බන්ධව ගුරුවරු හා විදුහල්පතිවරු පුහුණුව | ගුරුවරු 178ක්, පිරිවෙන් ගුරුවරු 28ක් හා විදුහල්පතිවරු 182ක් | වැඩසටහන් 9ක් | 1.69 | | අන්තර්ජාලය, ඊ- ඉගෙනුම්, තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ දැනුම හා කුසලතාව |
| තොරතුරු තාක්ෂණ ගුරුවරු ජාවා වැඩසටහන් සැකසීම පිළිබඳව පුහුණුව | තොරතුරු තාක්ෂණ ගුරුවරු 28ක් | දින 5 වැඩසටහන් 1ක් | 2.04 | | ජාවා වැඩසටහන් සැකසීම පිළිබඳ දැනුම හා කුසලතාව |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණුකරුවන් පුහුණුව | පුහුණුකරුවන් 150ක් | දින 4 වැඩසටහන් 3ක් | 0.55 | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ කුසලතා |
| නව විද්‍යාපීය ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | නව විද්‍යාපීය ගුරුවරුන් 80ක් | එක් වැඩසටහනක් | 0.68 | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ දැනුම හා කුසලතා |
| **පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | | | | | |
| ඇගයුම්කරුවන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණුව | පුහුණුකරුවන් 100ක් | වැඩසටහන් 11ක් | 1.42 | | පාසල් ඇගයීම පිළිබඳ කුසලතා |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ වන ක්‍රියාකාරකම් පිළිබඳව සියලුම පාර්ශව දැනුම්වත් කිරීමේ වැඩසටහන් යටතේ පළාත් 9ට අදාළ විදුහල්පතිවරු හා නිලධාරීන් දැනුම්වත් කිරීම. | විදුහල්පතිවරු 1000ක් හා නිලධාරීන් 103ක් | වැඩසටහන් 13ක් | 1.57 | | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ වන ක්‍රියාකාරකම් පිළිබඳව සියලුම පාර්ශව දැනුම්වත් කිරීම |
| අභ්‍යන්තර හා බාහිර ඇගයීම නියාමනය සම්බන්ධව ගුරු උපදේශකවරු පුහුණුව | ගුරු උපදේශකවරු 60ක් | එක් වැඩසටහනක් | 0.14 | | අභ්‍යන්තර හා බාහිර ඇගයීම නියාමනය සම්බන්ධ දැනුම |
| **පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය** | | | | | |
| පාසල් නායකත්වය සහ කළමනාකරණ ජාතික නිපුණතා රාමුවෙහි මූලික විදුහල්පති පාඨමාලාව යටතේ පළාත් මට්ටමින් විදුහල්පතිවරු පුහුණුව | විදුහල්පතිවරු 829ක් | | 20.16 | | පාසල් නායකත්වය සහ කළමනාකරණය පිළිබඳ දැනුම හා කුසලතා |
| විදුහල්පති සේවයට මෙම වසරේ බඳවාගත් නවක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සඳහා මූලික පුහුණුව | විදුහල්පතිවරුන් 1858ක් | මාසයක් | 65.49 | | මූලික විදුහල්පති පුහුණුව |
| අලුතින් පද්ධතියට බඳවාගත් ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණුව | ක්‍රීඩා පුහුණුකරුවන් 3,888ක් | මාස 6ක් | 446.21 | | පාසල් ක්‍රීඩා පිළිබඳ දැනුම හා කුසලතා |
| අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය ඇතුළු අධ්‍යාපන කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා කෙටිකාලීන පුහුණුව | සාමාජිකයන් 480ක් | දින 5ක වැඩසටහන් | 22.73 | | අදාල විෂයයන් යටතේ පුහුණුව |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| මධ්‍ය කාලීන සැලැස්ම සඳහා ඉලක්ක පිහිටුවා ගැනීම පිළිබඳව අන්තර් ජාතික විශේෂඥවරයෙකු විසින් පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩසටහන | විෂය අධ්‍යක්ෂවරු සහ පළාත් සැලසුම් නිලධාරීන් 55ක් | දෛනික වැඩසටහනක් | 0.59 | | සැලැස්ම සඳහා ඉලක්ක සකස් කිරීම පළිබඳ දැනුම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා අන්තර්ජාතික අත්දැකීම් |
| GEMP ව්‍යාපෘතිය සඳහා ඉලක්ක සකස් කර ගැනීමේ වැඩසටහන | විෂය අධ්‍යක්ෂරු සහ පළාත් සම්බන්ධීකාරක නිලධාරීන් 26ක් | එක් දින වැඩසටහනක් | 0.12 | | ව්‍යාපෘතිය සඳහා ඉලක්ක පිහිටුවා ගැනීමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ධාරිතා සංවර්ධනය |
| **අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය** | | | | | |
| අධ්‍යාපන පර්යේෂණ පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන | නිලධාරීන් 12ක් | වැඩසටහන් 03ක් | 0.15 | | අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද |
| පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පාඨමාලාව | කණ්ඩායම් දෙකකින් සමන්විත නිලධාරීන් 80ක් | ඉරු දින 16ක් | 3.36 | | අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද |

### 6.3.2 විදේශීය වැඩසටහන්

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානවල (PICTEC සහ ZICTEC) උපදේශන සේවා මෘදුකාංග සංවර්ධන කණ්ඩායම්, ගුරුවරුන් සඳහා කොරියාවේ ග්රැන්ජු මෙට්‍රොපොලිටන් ආයතනයේ පුහුණුව | ගුරුවරුන්ගෙන් සමන්විත 25ක කණ්ඩායමක් | දින 14ක් | 4.88 | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ දැනුම හා කුසලතා |
| නායකත්ව සංවර්ධනය සඳහා කලාප හා කොට්ඨාස නිලධාරීන් සඳහා විදේශ පුහුණුව | නිලධාරීන් 50ක් | දින 7ක් | 9.67 | | නායකත්ව සංවර්ධන දැනුම හා කුසලතා |
| විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා විදේශ පුහුණුව - කොරියාව | නිලධාරීන් 25ක් | සති 2ක් | 2.35 | | විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය |

# 07. පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| **03.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ විෂය පථය විශාල බැවින් අදාළ පිළිතුරු ලබා ගැනීමේ දී ඇතිවන ප්‍රමාදයන් මත නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථා ද ඇත. | |
| **6.** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණ වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කලමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම. | අනුකූල වේ | | |

| අංක ය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **8.** | **වත්කම් කළමනාකරණ කමිටු** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරන සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේක අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පුර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගනණය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනිවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. (1)94 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සෑම උත්සහයක්ම ගෙන ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල නොවේ | නිරවුල් නොවූ ශේෂ ද පවතී. | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචන වර්ෂ අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිවැරදි කිරීම් / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල නොවේ | ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017ප්‍රකාරව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීක කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක0 2/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මානව සම්පත් සංවර්ධන අංශය මඟින් සිදු නොකෙරේ. | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ | නිලධාරීන් සියළු දෙනා අමාත්‍යාංශයේ අනන්‍යවූ කාර්ය සාධන පත්‍රිකාවක් අත්සන් කෙරේ. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |



කේ.පී.එස්.පී. වීරකෝන්

ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍යාපන ලේකම් වෙනුවට

# ඇමුණුම්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EDU-A-MOE-19-SR-25 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 මැයි 29 දින

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු නමුත්, පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
| --- | --- | --- |
| 1.6.6 (අ) | 2008 අප්‍රේල් 30 දිනැති අංක 2008/17 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පහසුකම් හා සේවා ගාස්තු හා පාසල් සංවර්ධන සමිති ගාස්තු හැර වෙනත් කිසිදු මුදලක් අය කළ නොහැකි වුවද, ඊට අනුකූල නොවී 2020 වර්ෂයේ උසස් පෙළ සඳහා බඳවා ගත් සිසුන් 193 දෙනෙකුගෙන් රු.මිලියන 2.8 ක මුදලක් දකුණු පළාතේ ප්‍රධාන පිරිමි පාසලකින් එකතු කර තිබුණි. මෙම මුදල් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකර නොතිබුණු අතර, දෙමාපිය කමිටු සාමාජිකයින් නමින් බැංකු ගිණුම් වල තැන්පත් කර තිබුණි. | පවතින ලිඛිත උපදෙස් අනුව කටයුතු නොකිරීම පිළිබඳව විනය පියවර ගැනීමට කටයුතු කළයුතුය. |
| 3.2 (අ) | ජාතික අධ්‍යාපන ක්‍රමයක් හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම | |
| | i. අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරිත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලාංකීය අධ්‍යාපනය සඳහා අධ්‍යාපන ප්‍රතිපත්තියක් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කළයුතුය. |
| | ii. 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2018 වර්ෂය අවසාන වන විටද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | -එම- |
| | iii. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාලව 2 වන ව්‍යවස්ථාව අනුව පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය පවරා තිබූ අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඒවා කළමනාකරණය කළ යුතුය. |

(ආ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

------------------------

2017 කාර්යසාධන වාර්තාව අනුව ජාතික සුපරීක්ෂණ අධිකාරිය පිහිටුවා එහි අරමුණුගත කාර්යයන් සිදුකිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකි වී තිබුණි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා අරමුණුගත කාර්යයන් නිශ්චිතව ඉටුකරලීම සඳහා කටයුතු කළ යුතුය.

(ඇ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් විය. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 5 ත් 14 ත් අතර වයස් සීමාවල පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු පුද්ගලයෙකු විසින් පෞද්ගලික පාසැල් ආරම්භ කළ නොහැකි වුවද පනතට අනුකූල නොවන අයුරින් ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් ආරම්භ කර තිබුණි.

වර්තමානයේ සීඝ්‍රයෙන් බිහිවෙන පුද්ගලික හා ජාත්‍යන්තර පාසැල් පිළිබඳ විධිමත් අධීක්ෂණයක් සහ නියාමනයක් සිදුකිරීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස සලකා කටයුතු කළයුතුය.

## 3.5 සිසුන් ඇතුළත් කිරීම

(ඇ) --------------------

වෘත්තිකයින්ගේ හෝ නිලධාරීන්ගේ දරුවන්ව ජනප්‍රිය පාසැල්වලට ඇතුළත් කිරීම සම්බන්ධ නිශ්චිත නිර්නායක, ක්‍රමවේද හෝ උපදෙස් නොතිබුණි. ඇතැම් වෘත්තිකයින් හා නිලධාරීන් සඳහා පමණක් ඒ සඳහා අවස්ථාව ලැබී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි.

පාසැල්වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා පොදු ක්‍රම වේදයක් හා ප්‍රතිපත්තියක් සැලසීම තුළින් සියළු සිසුන්ට සම අවස්ථා නිර්මාණය කළයුතුය

(ඉ) කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගී පරපුරක් දැයට දයාද කිරීම ක්‍රීඩා දක්ෂතා සහිත සිසුන් දක්ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවක් අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම සඳහා අරමුණු 7 ක් මුල් කරගෙන 2016 සිට ඉදිරි වර්ෂ 5 ක් තුල ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 18,394.5 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර, 2017 වර්ෂය සඳහා රු. මිලියන 250 ක, 2018 වර්ෂය සඳහා රු.මිලියන 300 ක හා 2019 රු.මිලියන 150 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. 2018 ට ලැබී තිබුණු රු.මිලියන 300 න් රු. මිලියන 99 ක් පමණක් වැයකර තිබු අතර, 2019 දී වැයකර තිබුණේ රු.මිලියන 98 ක් පමණි.

ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකමින්, කායික හා මානසික සමබර අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් සියළු සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම සඳහා අරමුණු ගත පරිදි කටයුතු කළයුතුය.

| | | |
|---|---|---|
| (ඍ) | පාසැල් ඉදිකිරීම් සඳහා එකම කොන්ත්‍රාත්කරුවන් කණ්ඩායමක් තෝරාගැනීම හේතුවෙන් එම පාසැල් රු.මිලියන 106.6 ක ඉදිකිරීම්වල අසාමාන්‍ය ප්‍රමාදයන් හා අඩුපාඩු පවතින බව නිරීක්‍ෂණය විය. | එකම කොන්ත්‍රාත්කරුවෙකුට විශාල ඉදිකිරීම් සංඛ්‍යාවක් පැවරීම නොකළ යුතු අතර, අදාළ කාල පරිච්ඡේදයන් තුල කොන්ත්‍රාත් පැවරීම හා සැලසුම් අනුව කටයුතු කිරීම පිළිබඳව අධීක්‍ෂණය කළයුතුය. |
| (එ) | පසුගිය වර්ෂ කිහිපය තුල තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්න සංඛ්‍යාවක් අසමත් වී තිබුණි. විභාග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව, 2017 වර්ෂයේදී උසස් පෙළ විෂයයන් ලෙස භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය හා තාක්‍ෂණය සඳහා විද්‍යාව හැදෑරූ සිසුන්ගෙන්ද 1/3 කට ආසන්න ප්‍රමාණයක් අසමත්ව තිබුණි. එසේ වුවද, ඒ සඳහා හේතුවී තිබුණු කරුණු හඳුනාගැනීමට සහ ඒ සඳහා පිළියම් යෙදීමට සුදුසු විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණි. ඉංග්‍රීසි සාහිත්‍ය, ප්‍රංශ, රුසියානු හා ජපන් භාෂා ගුරුවරුන්ගේ ගුරු පුරප්පාඩු 52 ක් වූ අතර, රුසියානු හා ජපන් භාෂා සඳහා පසුගිය වසර පහක කාලය තුල ගුරුභවතුන් බඳවාගෙන නොතිබුණි. 2014 වසරේ සිට 2019 වසර දක්වා ඉංග්‍රීසි සාහිත්‍ය ගුරුවරුන්ට පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි. ගුරු පුරප්පාඩු පැවතීමත් හා ගුරු පුහුණු වැඩසටහන් නොපැවැත්වීමත් සිසුන්ගේ අධ්‍යයන මට්ටමේ පසුබෑමට හේතු වී තිබුණි. | සමස්ථ ප්‍රතිඵල ඇගයීම තුලින් ව්‍යුහය තුල පවතින අඩුපාඩු හඳුනාගෙන නිසි අධ්‍යයනයකින් පසුව ඒ ඒ නිවැරදි කිරීමට අවශ්‍ය පිළියම් යෙදිය යුතුය. විෂයයන් ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීම, අවශ්‍ය පරිදි ගුරු පුහුණුව ලබාදීම හා විෂ්‍ය ඉගැන්වීම් පිළිබඳව අධීක්‍ෂණය කිරීම තුලින් විෂය ගැටළු හඳුනාගෙන ඒ අනුව ගුණාත්මක විෂය ඉගැන්වීමක් සිදුකෙරෙන බව තහවුරු කරගැනීමට අවශ්‍ය පිළියම් යෙදිය යුතුය. |
| (ඒ) | දිවයිනෙහි පවතින පාසැල් සංඛ්‍යාව වන 10,162 කින් ස්ථිර පුස්තකාල පහසුකම් පවතින පාසැල් 3,499 ක්ද කියවීම් කාමර 2,185 ක් සහ තාවකාලික පුස්තකාල 3,314 ක් විය. පාසැල් සියයට 34 කට පමණක් ස්ථිර පුස්තකාල පැවතුණ අතර, පාසැල් 1,164 කට පුස්තකාල හෝ ඒ හා සමාන කියවීමේ ඉඩකඩක් හෝ නොපැවතුණි. අමාත්‍යාංශය විසින් අදියර 3 ක් යටතේ 2018 වර්ෂයේදී රු.මිලියන 3.63 ක් වැයකර පළාත් 9 හි කලාප 98 ක පුස්තකාල විෂය භාර අධ්‍යක්‍ෂවරු 80 දෙනෙක් පුහුණු කර තිබුණද, මෙම පුහුණුවේ ඵලදායීත්වය පළාත් නිලධාරීන් හරහා පාසැල් වෙත විහිද ගොස් නොතිබුණි. | සියළු සිසුන් වෙත පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීමටත් සුදුසුකම් ලත් නිලධාරීන් පුස්තකාල සඳහා අනුයුක්ත කිරීමටත් කටයුතු කළයුතුය. |

පාසැල්වල සේවා නියුක්ත පුස්තකාලාධිපතිවරුන් 2,607 කින් 1,906 දෙනෙකු පුස්තකාලාධිපති තනතුර සඳහා කිසිදු සුදුසුකමක් ලද අය නොවිය.

4. තිරසර සංවරධන අරමුණු ළඟා කරගැනීම

| | |
|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනුවත් වී තිබුණු නමුත්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟ විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2030 වර්ෂයේදී ලඟා කරගත යුතුව ඇති අධ්‍යාපනය සම්බන්ධ වූ තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීමට අවශ්‍ය සැලසුම් සකස් කර එය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කළයුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්

i. අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු. 87,473,156,400 ක අනුමත අග්‍රිම සීමාවක් පැවතුණ නමුත් එක් එක් මාසය වෙනුවෙන් ඉකුත් මාසවල නොලැබුණු ප්‍රමාණයන්ද සමඟ ඉල්ලුම් කර තිබුණු අග්‍රිමවල එකතුව රු. 98,821,478,000 ක් විය. එසේ වුවත්, වර්ෂය සඳහා ලැබී තිබුණු මුළු අග්‍රිම වටිනාකම රු. 65,644,855,470 ක් වූ බැවින්, අනුමත සීමාවෙන් රු. 21,828,300,930 ක් හෙවත් සියයට 25 ක ප්‍රමාණයක් ලැබී නොතිබුණි.

ii. 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් රු. 65,644,855,470 ක් ලැබී තිබුණු අතර, වෙනත් මූලාශ්‍රවලින් රු. 749,257,046 ක් ලැබී තිබූ බවට ACA - 03 ආකෘතියෙහි දක්වා තිබුණි. නමුත් වෙනත් මූලාශ්‍ර පිළිබඳ තොරතුරු ගිණුමේ විස්තරාත්මකව දක්වා නොතිබුණි.

1.6.1.2 අත්තිකාරම් ගෙවීම්

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා වෙනත් නිලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ මුළු ශේෂය රු. 159,311,292 ක් වූ අතර, ඉන් රු. 68,529,282 ක් වූ ශේෂයන් වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණු නමුත් ඒවා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

ii. විගණනයට ඉදිරිපත් කර තිබෙන සැසඳුම් ප්‍රකාශ අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ අවසාන ශේෂය වර්ෂ ගණනාවක සිට නොසැසඳී පැවතුණි. මෙම නොසැසඳීම හඳුනාගෙන නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද අපොහොසත් වී තිබුණු අතර, ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට රු. (9,552,600) ක නොසැසඳුනු ශේෂයක් පැවතුණි.

iii. 1983 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 370,423 ක මුදලක් හා 1990 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 5,972,773 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද නිරවුල් කර නොතිබුණි.

iv. 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 262/2017 හි 4 වන ඡේදයෙහි 2018 සිට ඉදිරි වර්ෂවල විශ්‍රාම හා මරණ පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ කිසිවක් තම ආයතනවල අත්තිකාරම් බී ගිණුම්වල ඇතුළත් නොකිරීමට ආයතන ප්‍රධානීන් වග බලාගත යුතු බව සඳහන් කර තිබුණි. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශ අත්තිකාරම් බී ගිණුමේ මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස රු. 18,899,815 ක් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

------------------------------

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

-----------------------

2019 වර්ෂය තුල ගිණුමෙහි පෙන්වා තිබූ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් රු. 10,462,289,443 ක් වූ අතර,භාණ්ඩාගාරයට අනුව අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් රු. 10,790,992,453 ක් විය. භාණ්ඩාගාරයේ පොත්පත්වල ආරම්භක ශේෂ ඇතුළත්වීම හේතුවෙන් භාණ්ඩාගාරයේ පොත්පත්වල හා ගිණුමෙහි දක්වා තිබූ ශේෂ අතර රු. 328,703,010 ක් වූ වෙනසක් පැවතියද එය සැසඳීමක් කර නොතිබුණි.

1.6.2.2 තැන්පතු ගිණුම් ශේෂ

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

තැන්පතු ගිණුමෙහි ඇප තැන්පත්, ටෙන්ඩර් තැන්පත්, අරමුදල් (මණ්ඩල), තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් සහ කොන්ත්‍රාත් සඳහා රඳවුම් මුදල් ආදී වශයෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු. 851,582,153 ක ශේෂයක් පැවතුණි. මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 2 ඉක්මවූ තැන්පතු රජයට බැරකළ යුතු වුවද, ඉහත තැන්පතු අතරින් රු. 216,504,056 ක වර්ෂ 2 ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකර නොතිබුණු අතර, ඒ තුළ වර්ෂ 5 ට වැඩි රු. 1,387,539 ක ශේෂද විය.

ඉකුත් වර්ෂය අවසානයට මු.රෙ. 571 අනුව නිරවුල් නොකළ වර්ෂ 2 ඉක්මවූ පොදු තැන්පත් ගිණුම් හතරක ශේෂය රු. 68,817,130 ක් වූ අතර, ඉන් ගිණුම් තුනක වූ රු. 23,138,315 ක ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටද නිරවුල් නොවී පැවතුණි.

1.6.2.3 අග්‍රිම ගිණුමේ ශේෂය

---

2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අග්‍රිම ගිණුමෙහි ශේෂය රු. 7,181,553 ක් විය.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 වියදම් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 වර්ෂය සඳහා වූ පුනරාවර්තන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් රු. 638,466,966 ක් ඉතිරිව තිබුණු අතර, එම ඉතිරිවීම් සියයට 51 සිට සියයට 80 දක්වා පරාසයක පැවතුණි.

ii. එක් පුනරාවර්තන වැය විෂයයක් වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබුණු රු. 243,500,000 ක මුළු වටිනාකමම උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

iii. 2019 වර්ෂය වෙනුවෙන් මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය රු. 43,930,000,000 ක් වූ අතර, ඉන් වැය විෂයයන් 27 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබුණු වටිනාකම රු. 11,495,177,410 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිව තිබුණි. එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26.17 ක් විය.

iv. වැය විෂයයන් 45 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය වූ රු. 13,713,319,850 කින් රු. 10,630,937,570 ක් ඉතිරිව තිබුණු අතර, එම ඉතිරිවීම් සියයට 50 සිට 99 දක්වා පරාසයක පැවතුණි.

v. වැය විෂයයන් 3 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබුණු රු. 104,863,653 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

vi. විදේශ ණය සහ විදේශ ප්‍රදාන ආදී වශයෙන් ලබාගෙන තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 7,440,000,000 කින් රු. 7,254,147,019 ක්ම ඉතිරිව තිබුණු අතර, ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 97.50 ක් විය.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) හි යම් මුදල් වර්ෂයකට අදාළ සියළුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කළයුතු බවත්, ඊලඟ වර්ෂය තුලදී නිරවුල් කිරීමේ අරමුණෙන් ඉදිරියට ගෙන නොයා යුතු බවත් සඳහන් කර තිබුණි. එසේ වුවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 4,787.73 ක බැරකම්ද රු.මිලියන 5,350.56 ක බැදීම්ද ඇති කරගෙන තිබුණි.

ii. චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවන ආකාරයට වැය විෂයයන් 14 ක් සඳහා රු. 1,960,130,133 ක බැරකම්වලට එළඹ තිබුණු අතර, එම වැය විෂයයන්හි ඉතිරිවීම්වල එකතුව රු. 1,194,874,365 ක් පමණක් විය.

iii. අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමෙහි ඇතුළත් ඇමුණුමේ සඳහන් බැදීම් හා බැරකම් විස්තර ගිණුම් හා නොසැසඳුණි.

iv. බැරකම් හා බැදීම් සඳහා බැංකුවල නම් සටහන් කර තිබුණු අතර, බැදීම් ඇති කරගත් ආයතන හා පුද්ගලයන් හඳුනාගැනීමට නොහැකි විය.

v. අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැදීම් හා බැරකම් උපලේඛන අනුව ඉකුත් වර්ෂය සඳහා බැරකම් ලෙස ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු රු. 464,879,038 ක් සමාලෝචිත වර්ෂයේදී පියවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදීද බැරකම්වල ඇතුළත් කර තිබුණි.

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ විගණන කටයුතුවලට අදාළව නිකුත් කරන ලද විගණන විමසුමේ 19 ක් සඳහා වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| i. 2018 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන අමාත්‍යාංශ චක්‍රලේඛය | 2008 සැප්තැම්බර් 19 දින අධ්‍යාපන ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු අංක 2008/37 දරන චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීමේදී සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් නිශ්චිත ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් යෝජනා කර නොතිබීම හේතුවෙන් පාසල්වල විදුහල්පතිවරුන් විසින් ලකුණු ලබාදීමේ නිර්නායක විවිධ ආකාරයට සකස් කරන බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| ii. 2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 අතිවිශේෂ ගැසට් පත්‍රය | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ලැයිස්තුගත ජාතික පාසල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරුන් වශයෙන් පත්කළ යුතුව තිබුණු නමුත් එම පත්කිරීම් සිදුකර නොතිබුණි. |
| iii. 2017 ජූලි 04 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/0039/VOL II දරණ ලිපිය | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 6.1 සටහනට අනුව අදාළ "අ" උපලේඛනයේ තනතුරු 2,691 ක් සංශෝධනය කර අනුමත කර තිබුණි. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු බවත්, ජාතික හා පළාත් පාසැල්වල විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති තනතුරු වෙනුවෙන් මෙම තනතුරු වෙන්වන ආකාරය පිළිබඳව සවිස්තරාත්මකව ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලෙසත් දන්වා තිබුණි. ජාතික පාසැල් සඳහා විදුහල්පති තනතුරු 148 ක් සහ නියෝජ්‍ය විදුහලපති තනතුරු 148 ක් අනුමත වී ඇති බවටද, ඊට අමතරව දකුණු පළාත සඳහා විදුහල්පතිවරු 12 ක් හා බස්නාහිර පළාත සඳහා විදුහල්පතිවරු 44 ක් වශයෙන් විදුහල්පති තනතුරු 56 ක් අනුමත වී තිබුණු බවද විගණනයට තොරතුරු ඉදිරිපත් කර තිබුණු නමුත්, ඉහත සඳහන් පරිදි තනතුරු වෙන්වන ආකාරය පිළිබඳව සවිස්තරාත්මක අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |

iv. **2016** මාර්තු **09** දිනැති අංක **05/2016** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ "අ" උපලේඛනයේ සඳහන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් වෙත මාසික ප්‍රවාහන දීමනාව ගෙවනු ලබන බව **නිරීක්ෂණය** විය. එසේ වුවද, එම ව්‍යවස්ථාවේ "අ" උපලේඛනයේ සඳහන් I වන ශ්‍රේණියේම තනතුරු දරණ විදුහල්පති තනතුරු **64** ක් වෙත එම ප්‍රවාහන දීමනාව ගෙවීම සඳහා කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ලැයිස්තුගත ජාතික පාසැල් **64** ක විදුහල්පතිවරුන් ලෙස නම් නොකිරීමද ඊට හේතුවක් වී තිබුණි.

v. **2018** ජනවාරි **24** දිනැති අංක **02/2018** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කරගැනීම සඳහා ආයතනික කාර්ය මණ්ඩලය යොදවනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය නොවීය.
2. මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.
3. එක් එක් නිලධාරී තලය අනුව හඳුනාගත් නිපුණතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සුදුසු ධාරිතා සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

vi. **2008** පෙබරවාරි **06** දිනැති අංක **05/2008** දරණ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීමේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය

මෙම චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අනුව එහි මූලධර්ම ලෙස සඳහන් පහත සඳහන් කරුණු සපුරා ගැනීම ප්‍රමාණවත් අයුරින් සිදුකර නොතිබුණි.

1. මහජන සේවා අවශ්‍යතා සහ ආයතනය සතු ධාරිතාවය සැලකිල්ලට ගනිමින් සේවා ප්‍රමිතීන් නියම කිරීම.
2. මහජනතාවට නිවැරදි කරුණු හා තොරතුරු විවෘතව සැපයීමට සහතික වීම.
3. සියල්ලන්ට ආචාරශීලිව, මිත්‍රශීලිව හා සාධාරණව සැලකීම මෙන්ම වරදක් සිදුවූ විට නිවැරදි කිරීම.
4. ඵලදායී ලෙස සම්පත් භාවිතය
5. පිළිගත හැකි විශ්වාසනීය ප්‍රතිචාර දැක්වීම.

vii. **2008** අප්‍රේල් **25** අංක **11/2018** පාසැල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා වූ උපදෙස් සංග්‍රහය

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ ජාතික පාසැල් 30 ක් පමණ අදාළ උපදෙස්වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

| | |
|---|---|
| viii. 1964 නොවැම්බර් 20 දිනැති අංක 1964/27 දරණ අමාත්‍යාංශ චක්‍රලේඛය සහ 1996 ජුනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් ලිපිය | ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා වශයෙන් විදුහල්පතිවරයා පත් කරගත යුතු වුවද, එසේ පත් නොකෙරුන ජාතික පාසැල් 10 ක් පමණ පැවතුණ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අදාළව නිකුත් කරන ලද මාස 06 ක කාලය ඉකුත් වූ රු. 3,250,821 ක් වටිනා චෙක්පත් 25 ක් 2019 දෙසැම්බර් 31 දක්වා බැංකුවට ඉදිරිපත්කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

P. H. Hemamali

එම්.අයි.පුෂ්පා හේමමාලි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට